(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1999 අංක 9 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 අප්‍රේල් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 අප්‍රේල් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **3.50** තැපැල් ගාස්තුව : රු. **3.50**

**1999 අංක 9 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 අප්‍රේල් මස 09 වන දින.]

එල්. ඩී.–ඕ. 8/97.

**1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 1999 අංක 9 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පනතේ 5 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 1988 අංක 53 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) ශ්‍රී ලංකාවට අදාළ සමාජ-ආර්ථික පර්යේෂණ, ශ්‍රී ලාංකික හෝ විදේශීය හෝ පර්යේෂණ ආයතන මගින් හෝ පුද්ගලයන් මගින් හෝ පැවැත්වීමට කටයුතු සැලැස්වීම;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: - ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (4) සහ (5) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් : -

"(4) විගණකාධිපතිවරයා විසින් ආයතනයේ ගිණුම් සෑම වර්ෂයක ම විගණනය කරනු ලැබිය යුතුය. ඒ ගිණුම් විගණනය කිරීමෙහි ලා තමාට සහාය වීම සඳහා (මෙහි මින් මතු "විගණකවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සුදුසුකම්ලත් විගණකවරයකුගේ සහාය විගණකාධිපතිවරයා විසින් ලබා ගනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ඒ විගණකවරයා ක්‍රියා කළ යුතුය. ඒ විගණන, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලැබිය යුතුය.

H - 022545

(5) ආයතනයේ ගිණුම් විගණනය කිරීමෙහිලා විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවීමේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක්, ආයතනයේ අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයා විසින් ආයතනයේ අරමුදලින් ලබා ගන්නා ලද යම් පාරිශ්‍රමිකයක්, ඒ විගණනය පැවැත්වීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් සහාය ලබා ගන්නා ලද විගණකවරයාට ගෙවන ලද මුදල් කිසිවක් ඉන් අඩු කිරීමෙන් පසු, ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතුය. :"

(2) ඒ වගන්තියේ (10) වන උපවගන්තියේ "විගණකවරයා" යන වචනය යෙදී ඇති සවර හෝ තැනක, ඒ වෙනුවට "විගණකාධිපතිවරයා" යන වචනය ආදේශ කිරීමෙන්: සහ

(3) ඒ වගන්තියේ (11) වන උපවන්තියේ දැක්වෙන "විගණකවරයා" යන වචනය වෙනුවට "විගණකාධිපතිවරයා" යන වචනය ආදේශ කිරීමෙන්. "

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.